# බුද්ධානුස්සති භාවනා පිරිත

## සහිත

# චතු විශාරද ඥාන දේශනා

සාසනධජ, ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය,
මහෝපාධ්‍යාය, මහා කර්මස්ථානාචාර්ය
අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ

මෙම උතුම් ධර්ම ග්‍රන්ථයේ සම්පාදක සාසනධජ, ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය, මහෝපාධ්‍යාය, මහා කර්මස්ථානාචාර්ය අතිපූජනීය නා උයනේ අරියධම්මාභිධාන මහා නාහිමිපාදෝත්තමයාණන් වහන්සේගේ දෙපා නැමද ගෞරව පූර්වක භක්ති ප්‍රණාම නමස්කාර පූර්වකව මෙම ධර්ම ග්‍රන්ථය මුද්‍රණය කිරීමට දායක වූ සියලුම පිංවතුන් ද ගෞරව පූර්වකව සිහිපත් කරමින් ධර්ම දානමය පුණ්‍ය කර්මයක් ලෙස ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් මෙම ධර්ම ග්‍රන්ථය මෙසේ සකසන ලද්දේ අරියමග්ග සංවිධානය විසිනි.

www.ariyamagga.org

මෙත් සිතුවිලි පින් දහරක

ශෝභමාන

කුශල සම්පත්තීන් කෙරෙහි

ලෝකොත්තර ප්‍රඥාව ද

උත්තරීතර සංසිඳීම ද පතා

මතු ලොවිතුරා බුදුවන

අපගේ ගුරුදේව රාජෝත්තම

අතිපූජ්‍ණීය නා උයනේ

අරියධම්ම ස්වාමීන් වහන්සේගේ

71 වෙනි පුණ්‍යකාමී ජන්ම දිනය

සිහිපත් කරමින් කෙරෙන උත්තම

ගුරු පූජාවකි.

# බුද්ධානුස්සති භාවනා පිරිත
# සහිත
# චතු විශාරද ඥාන දේශනා

**සංස්කාරක**

ත්‍රිපිටකාචාර්ය මහා කම්මට්ඨානාචාර්ය

අති පූජ්‍යය නා උයනේ අරියධම්ම ස්වාමින් වහන්සේ

**ධර්ම දානය**

එස්. බී. දිවාරත්න මහත්මයා

දිවාරත්න මහත්මිය

Lithira

බුද්ධානුස්සති භාවනා පිරිත
සහිත චතු විශාරද ඥාන දේශනා

ත්‍රිපිටකාචාර්ය මහා කම්මට්ඨානාචාර්ය
අති පූජ්‍යය නා උයනේ අරියධම්ම ස්වාමින් වහන්සේ


ප්‍රථම මුද්‍රණය - 1994

දෙවන මුද්‍රණය - 2010

මුද්‍රණය

ලිතිර
Lithira Printing Industries
306, ඇඹුල්දෙණිය හංදිය,
නුගේගොඩ.

0718152131
0114921309

# හැඳින්වීම

## දෙවැනි මුද්‍රණය

චතු විශාරද ඥාන පිළිබඳව ධර්ම ග්‍රන්ථය මෙවර අපගේ ජන්ම දිනය සිහිපත් කරමින් මුද්‍රණය කරනු ලබන්නේ සත්ගුණවත් එස්.බී. දිවාරත්න මහත්මයා සහ දිවාරත්න මහත්මනී විසිනි.

1994 පෙබරවාරි 25 දා ගල්දූවේ අභිනව පොකුණ පූජා කළ නවම් පොහෝ දින දේශනා කරන ලද චතු විශාරද ඥාන දේශනාව දහම් පොතක් වශයෙන් මුද්‍රණය කරවීමට ලියා දෙනු මැනව'යි කරන ලද කාරුණික ආරාධනාව පරිදි විශේෂ ධර්ම දේශනාදී ආගමික කටයුතු රැසක් සඳහා ඕස්ට්‍රේලියාවේ බ්‍රිස්බන් නුවරට වැඩිය බැවින් එහිදී ලැබුණ විවේක අවසරයේ දී මෙය ඉතා සැකෙවින් සකස් කළෙමි.

මෙහි විශාරද ඥාන සතර විවරණයට අනතුරුව විශාරද ඥාන පිරිතක් යෙදිමි. එය නිතර භාවිතයට සුදුසු ආරක්‍ෂක පිරිතක් වනු ඒකාන්තය. පිරිතට අනතුරුව ඇත්තේ විශාරද ඥාන අනුව බුදු ගුණ භාවනාවකි. එය නිතිපතා භාවිතා කිරීමට සුදුසු වූ අනුස්සතියකි. මහ සයුරේ කොතැනකින් දිය බිඳුවක් ගත්තේ ද එහි එකම ලවණ රසය ඇත්තා සේ බුදුගුණ සයුරේ කොතැනකින් ගුණ පදයක් ගත්තේ ද එහි ඇත්තේ අමා මිහිරකි. ශාන්ත රසයකි. රුවන් ගබඩාවකට ඇතුළු වූ පුද්ගලයා හාත්පස රන්-රුවන්, මුතු-මැණික්, ආලෝකයේ කාන්තිය පැතිරෙන්නා සේ, බුදු ගුණ ගබඩාවට ඇතුළු වූ පුණ්‍යවන්තයා හාත්පස ද බුදු ගුණ රුවනේ කාන්තිය පැතිරෙනු ඒකාන්තය. බුදු ගුණයෙන් සැනසෙනු කැමැත්තෝ නිරන්තරයෙන් මෙවැනි බුද්ධානුස්සති භාවනා වඩත්වා !!!

සියලු ආමිස දානයන් අභිබවා ජය ගන්නා වූ ධර්ම දානමය කුසලය දස දහසක් සක්වල දෙව් බඹුන් මැද දී උසස් ම කුසලයක් බව දේශනා කරන ලද්දේ සර්වඥයන් වහන්සේ විසිනි. මෙම ධර්ම දානමය කුසලානුභාව බලයෙන් සත්ගුණවත් එස්. බී. දිවාතරත්න මැතිතුමාට සහ එම දිවාරත්න මහත්මනිටත් දරු තුන් පල වන චාමින්ද, කාලිංග, ලක්මාලි දරුවන්ට ද, ලේලි වරු දෙදෙනා වන නන්දිමා, නිශාන්ති දරුවන්ට ද බෑණා වන රබිත දරුවාට ද, මුණුබුරු මිණිබිරියන් වන සෙනාල්, සෙත්, ඕෂධී දරුවන්ට මෙම ධර්ම දානමය කුසලය අනුමෝදන් වී, ආයුරාරෝගයාදී ශ්‍රී සම්පත් සහ දෙලොව සුබසෙතත්, ශාන්ති ලක්ෂණ නිර්වාණ ධාතුවත් සාක්ෂාත් වේවා!!!

ඕස්ට්‍රේලියාවේ උසස් අධ්‍යාපනය හදාරන ලක්මාලි දිවාරත්න දියණියට උසස් ප්‍රතිඵල නෙලා ගැනිමට මෙම කුසලය හේතු වේවා! වාසනා වේවා! නිදුක් නිරෝගීව සුවසේ පහසු විහරණයෙන් පාරමී ගුණ සපුරා නිවනින් සැනසෙත්වා!!!

කල්‍යාණ මිත්‍ර ඥාති සැමටත්, බුදු ගුණ බලයෙන් ආයුරාරෝග්‍ය ශ්‍රී සම්පත් අභිවර්ධනය වේවා! සම්‍යක් ප්‍රාර්ථනා සියල්ල සඵල වී ශාන්ති ලක්ෂණ අමෘත මහා නිර්වාණ ධාතුව සුවසේම සාක්ෂාත් වේවා!!!

"සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා"

මෙයට,
මෙතැති

නා උයනේ අරියධම්ම ස්ථවිර — 2010-04-10

*ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානය,*

*ගල්දූව,*

*කහව.*

# උතුම් ආශිර්වාදයක් වේවා !

"සබ්බ දානං ධම්ම දානං ජිනාති"
(සියලු දානයන් පරදා ධර්ම දානය ජයගනී)

තථාගත සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේගේ බුදු ගුණ වර්ණනාවක් සහිත මෙම දහම් පොත දෙවැනි වරට මුද්‍රණය කර දහම් පඬුරක් වශයෙන් පූජා බුද්ධියෙන් සිදුකරනු ලබන්නේ සත් ගුණවත් එස්.බී. දිවාරත්න මහත්මයා සහ දිවාරත්න මහත්මතී යන දෙපළ විසිනි. ශ්‍රී සද්ධර්මයේ පිහිට ආරක්‍ෂාව සැදැහැවත් බෞද්ධයන්ට ලබාදීමේ පරමාර්ථයෙන් මෙම දුර්ලභ දහම් පොත මුද්‍රණය කිරීමට තීරණය කළේ අපට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා දෙනු ලබන ඕෂධී තාරකාවක් සේ ගගන තලයේ බැබලෙමින් දෙලොව සුගතිය සාදා දෙන සියලු දෙනාගේ ගෞරවයට පාත්‍ර වූ අති පූජනීය නා උයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේගේ හැත්තෑඑක් වෙනි ජන්ම දින සිහි කරමිනි.

මෙම ධර්ම දානමය කුසලානිශංස බලයෙන් ශතවර්ෂාධික කාලයක් නිදුක් නිරෝගීව අප වැනි අසරණ සත්ත්වයින්හට සුගති මග කියා දෙමින් දහම් පිපාසයෙන් පෙළෙන දෙලොව දහසක් දෙනා සම්‍යක් දෘෂ්ඨිය ඇතිව පාරමී ගුණ ධර්ම පුරා ගැනීමට නිවැරදි මග කියා දීමට සියවස් කලක් දිගාසිරි ලබත්වා!

මෙම කුසලය අනුමෝදන් වී අනාගතයේ ලබන්නා වූ ලොවුතුරා බුද්ධත්වයට පාරමී ශීර්ෂයෙන් සියලු සම්‍යක් ප්‍රාර්ථනා මුදුන් පමුණුවා ගන්න ශක්තිය ධෛර්‍ය්‍යය වීර්‍ය්‍යය ආශිර්වාදයක් ම වේවා'යි එක සිතින් ප්‍රාර්ථනය කරන්නෙමු.

එසේම බෝධිසත්ව උතුමෙක් අපට පහළ කර දුන් සත්ගුණවත් දෙමාපියන්ට, කොහේ සිටියත් තමා කළ පිනක් සේ අනුමෝදන් වී ධර්මාවබෝධය පිණිස හේතු වේවා! වාසනා වේවා!

එසේම යෝගාශ්‍රම සංස්ථාව පිහිටුවා අපවත් වී වදාළ අති පූජනීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංශාභිධාන මාහිමිපාණන් මෙම කුසලය අනුමෝදන් වී මතු ලොවුතුරා බුදු වේවා!

නා උයන ආරණ්‍ය සේනාසනය රැක ගනිමින් දිවා රෑ වෙහෙස නොබලා කටයුතු කරන අති පූජනීය අඟුල්ගමුවේ අරියනන්ද මාහිමිපාණන් වහන්සේ නිදුක් නිරෝගී දිගාසිරි ලබා ප්‍රාර්ථනීය බෝධියකින් ධර්මාවබෝධය පිණිස මෙම ධර්ම දානමය කුසලය හේතු වේවා! වාසනා වේවා!!!

නිරන්තරයෙන් වෙහෙස වෙමින් අප නා උයනේ මාහිමිපාණන් වහන්සේ රැක බලා ගන්නා වූ පූජනීය නාග පොකුණේ අරියශීල ස්වාමීන් වහන්සේට පැමිණ ඇති සියලු බාධා ඉවත් වී දිගාසිරි ලබා ධර්මාවබෝධය පිණිස හේතු වේවා! වාසනා වේවා!!!

එසේම යෝගාශ්‍රම සංස්ථාවේ සියලුම මහා සංඝරත්නයට මෙම කුසලය අනුමෝදන් වී නිදුක් නිරෝගී සුව ලබා බුදු සසුන අවුරුදු පන්දහසක් කල් පවත්වා ගැනීමට මැණික් කැට මෙන් පේලි වෙවී මතු ප්‍රාර්ථනීය බෝධියකින් ධර්මාවබෝධය ලබත්වා!!!

අපගේ දරු තිදෙනා වන චාමින්ද, කාලිංග, ලක්මාලි දරුවන්ට ද, ලේලිවරු දෙදෙනා වන නන්දිමා, නිශාන්ති දරුවන්ට ද, බෑණා වන රබිත දරුවාට සහ මුණුබුරු මිණිබිරියන් වන සෙනාල්, සෙත්, ඕෂධී දරුවන්ට මෙම ධර්ම දානමය කුසලය අනුමෝදන් වී නිදුක් නිරෝගීව සියවස් කලක් පාරමී පූර්ණය කරගනිමින් තමන්ගේ අභිවෘද්ධිය ඉෂ්ඨ කර ගනිමින් පාරමී පුරා අප ප්‍රාර්ථනය කරන අමා මහා නිවන් සම්පත් ලබා ගැනීමට උපකාරී වේවා!!!

ඕස්ට්‍රේලියාවේ උසස් අධ්‍යාපනය හදාරන ලක්මාලි දිවාරත්න දියණියගේ අධ්‍යාපන කටයුතු උසස් ලෙස නිමකර ගැනීමට මෙම කුසලය අනුමෝදන් වී සියලු සම්‍යක් ප්‍රාර්ථනා සමෘද්ධිමත් කර ගනිමින් පාරමී පුරා ධර්මාවබෝධ පිණිස හේතු වේවා! වාසනා වේවා!!!

කල්‍යාණ මිත්‍ර හැම දෙනාට සහ මෙම පොත පරිශීලනය කරන සැමට මතු ධර්මාවබෝධය පිණිස නිදුක් නිරෝගිව සියලු සම්‍යක් ප්‍රාර්ථනා මුදුන් පත්කර ගැනීමට පහසු විහරණය ලැබේවා!!!

සම්‍යක් දෘෂ්ඨික දෙවිවරුන් මෙම පින් අනුමෝදන් වී සම්බුදු සසුන ආරක්‍ෂා කර දිව්‍ය සැප සම්පත් ලබත්වා!!!

මෙම පොත මුද්‍රණය කර අප වෙත ලබා දෙන ලිතිර මුද්‍රණාලයාධිපති පින්වත් කමල් ඇඹුල්දෙණිය මහතා ඇතුළු කාර්යය මණ්ඩලයට මෙම කුසලය අනුමෝදන් කරමු, අනුමෝදන් වේවා!!!

මෙයට

ශාසනාලයැති,

එස්.බී. දිවාරත්න මහත්මා සහ මහත්මිය.

2010-04-10

# චතුර් වෛසාරාද්‍ය ඥාන
# හෙවත්
# විශාරද නුවණ සතර

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස///

වෙසා රජජානි චතතාරි
බුදධතෙන ආසවකඛයෙ
අනතරායෙ ච නියයානෙ
යෙ හි බුදෙධා විසාරදො

"බුද්ධත්වය - ආශ්‍රවක්ෂය - අන්තරායිකය - නෛර්යාණිකය යනුවෙන් විසාරද නුවණ සතරකි. සර්වඥයන් වහන්සේ මේ සතර කරුණෙහි විසාරද වන සේක." යනු ඒ ගාථාවෙහි තේරුමය.

විසාරද යනු නිර්භයතාවට නමකි. සාරජ්ජ යනු තැතිගන්නා වූ වෙව්ලන්නා වූ බියගුලු ස්වභාවයයි. විගතං සාරජ්ජං යසස සො විසාරදො යමෙකු ගේ බිය තැති ගැනීම් නැත්තේ ද හෙතෙම වේසාරජ්ජ හෙවත් විසාරද නම් වේ. සිද්ධාර්ථ ගෞතම ශාක්‍යමුනීන්ද්‍ර සර්වඥ රාජෝත්තමයන් වහන්සේ දශබල ඥාන, චතුර් වෛසාරාද්‍ය ඥාන, ෂඩ් අසාධාරණ ඥාන, අෂ්ඨාරස ආවේණික බුද්ධ ගුණ ආදී අනන්ත ඥාන සම්භාරයෙන් සමන්නාගත වන සේක්. චතුර් වෛසාරද්‍ය ඥාන හේතු කොට සැමදා සැමතැනම විසාරද වන බව ඒකාන්තය.

පරතෙරට පත් උගතා සද්ධර්ම විශාරද නමින් ද හැඳින්වේ. යම් යම් විෂයයක් සම්බන්ධව ඉතිරි නැතිව සර්වාකාරයෙන් දන උගත් එම හේතුවෙන් ලැබෙන අවංකභාවය නොසැලෙන අචලභාවය සහ නිර්භයතාව මෙහිලා විශාරද බව නමින් කියැවේ. සියල්ල දත් සර්වඥයන් වහන්සේට වනාහි අනන්ත ඥාන සම්භාර ඇති අතර කරුණු සතරක් නිමිති කොට ලැබෙන ඥාන ගතිය චතුර්වෛසාරද්‍ය ඤාණ යනුවෙන් වෙන් කොට වදාරා තිබේ. අභිධර්ම පිටකයේ දෙවැනි ග්‍රන්ථය වන විභංගප්‍රකරණයේ එන ඤාණ විභංග දේශනාවෙහි වදාරා ඇති විශාරද ඥාන සතර මෙතැන් සිට අනුපිළිවෙලින් දක්වෙති.

1. බුද්ධත්වයෙහි විශාරද ඥානය

සම්මා සම්බුද්ධස්ස තෙ පටිජානතො ඉමෙ ධම්මා අනභිසම්බුද්ධාති, තත්‍ර වත තථාගතං සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා. ලොකස්මිං සහධම්මෙන පටිචොදෙස්සතී ති නිමිත්තං මෙතං තථාගතො න සමනු පස්සති එතම්පි නිමිත්තං අසමනුපස්සන්තො තථාගතො ඛෙමප්පත්තො අභයප්පත්තො වෙසාරජ්ජප්පත්තො විහරති.

"සියල්ල දන්නා වූ, සියල්ල දක්නා වූ, සර්වඥතා ඥානය හෙවත් බුද්ධත්වය ප්‍රතිඥා කරන ඔබ වහන්සේ විසින් මෙනම් ධර්මයෝ අවබෝධ නොකරන ලදහයි, පැවිද්දෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ලෝකයේ කවරෙක් හෝ හේතු කරුණු සාධක සහිතව චෝදනාවක් කරන්නේය යන මේ කාරණය තථාගතයන් වහන්සේ ඒකාන්තයෙන් නොදකින සේක. මෙවැනි චෝදනාවක් නොදක්නා බැවින් තථාගතයන් වහන්සේ සැමදා සැමකල්හි නිර්භයතාවයට විශාරද බවට පැමිණ වාසය කරන සේක." යනු මෙහි තේරුමයි.

2. ආශ්‍රවක්ෂයෙහි විශාරද ඥානය

"ඛීණාසවස්ස තෙ පටිජානතො ඉමෙ ආසවා අපරික්ඛීණාති තත්‍ර වත තථාගතං සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා ලොකස්මිං සහධම්මෙන පටිචොදෙස්සතී ති නිමිත්තමෙතං

බුදු බව සඳහා විසි අසංඛ්‍ය කල්ප ලක්ෂයක් තරම් අති දීර්ඝ කාලයක් තිස්සේ දානාදී පාරමී ධර්මයන් පූරණය කළ සේක. මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂා නම් වූ බ්‍රහ්මවිහාර ගුණ වැඩූ සේක. සැම සතුන් වෙත අවංක හිතාධ්‍යාශයෙන් යුතුව සත්ත්වයන්ගේ දුක තමන්ගේ දුකක් මෙන් සිතා අනුන්ගේ සම්පත් චිරාත්කල් පවතීවා යන හැඟීමෙන් හා අපක්ෂපාතව සම සිතින් යුතුව 'මොහුට දිය යුතුය. මොහුට නොදිය යුතුය'යි වෙනසක් නොකොට සැම සත්නටම දානය සැප සම්පත් නිදානය සලකා දන් දුන් සේක.

සත්ත්වයන්ගේ විනාශය ගැන අනුකම්පාවෙන් යුතුව ජීවිත පූජාවෙන් ශීලය පිරූ සේක. ශීල පරිපූරණය ම සඳහා නෛෂ්ක්‍රම්‍යය ද භජනය කළ සේක. සත්ත්වයන්ගේ ම හිත සුව ගැන නො මුළාවනු පිණිස ප්‍රඥාව ද වැඩු සේක. සත්ත්වයන්ගේ ම හිත සුව සැලසීම සඳහා වීර්යය වැඩූ සේක. වීර්යයෙන් ඉහළටම නැග මහා වීර භාවයට පැමිණි නමුත් සත්ත්වයන් ගේ අපරාධයන් ඉවසා වදාළ සේක.

"මෙනම් දේ තොපට දෙන්නෙමි. මෙනම් උපකාරය කරන්නෙමි." යයි කරන ලද ප්‍රතිඥාව ඒ ලෙසම සපුරමින් සත්‍යවාදී වූ සේක. ඔවුන්ගේම හිත සුව පිණිස සේවය කිරීමෙහි නොසැලෙන අධිෂ්ඨානය වැඩූ සේක. සැම සතුන් කෙරෙහි නොසැලෙන මෛත්‍රියෙන් උපකාරී වූ සේක. හිත-අහිත-මැදහත් සැම සතුන් කෙරෙහි සම සිත් ඇතිව ප්‍රත්‍යුපකාර අපේක්ෂා නොකොට උපේක්ෂක වූ සේක. මෙසේ මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂා ගුණ පූර්වාංගම කොට දානා දී සකල කල්‍යාණ ධර්ම පූරණය කිරීම් හේතුවෙන් සර්වඥයන් වහන්සේ දශබල චතු විසාරද සට් අසාධාරණ ඥාන අෂ්ටාරස ආවේණික බුද්ධ ගුණ ආදී අනන්ත ඥාන සම්භාර සහිතව උතුම් බුදුබවට පත් වූ සේක.

භාෂා ශාස්ත්‍රයන්හි පරතෙරට උගතා භාෂා විශාරද, ශාස්ත්‍ර විශාරද නමින් ප්‍රසිද්ධ වේ. විද්‍යාවෙහි පරතෙරට ගිය තැනැත්තා විද්‍යා විශාරද නම් ද වෙයි. අභිධර්මය නිමවා දත් උගතා අභිධර්ම විශාරද නමින් ද විනය පරතෙරට දත් විනයධරයා විනය විශාරද නමින් ද සූත්‍රාන්තයෙහි

තථාගතො න සමනුපස්සති, එතම්පි නිමිත්තං අසමනුපස්සන්තො තථාගතො ඛෙමප්පත්තො අභයප්පත්තො වෙසාරජ්ජප්පත්තො විහරති."

"සකලක්ලේශයන් නසන ලද්දා වූ ක්ෂීණාශ්‍රව භාවය ප්‍රතිඥා කරන ඔබවහන්සේ විසින් මෙනම් ආශ්‍රවයන් ප්‍රහාණය නොකරන ලද්දාහු යයි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ලෝකයෙහි කවර කෙනෙක් හෝ හේතු කරුණු සාධක සහිතව චෝදනා කරන්නේය යන මේ කාරණය තථාගතයන් වහන්සේ ඒකාන්තයෙන් නොදක්නා සේක. මෙවැනි චෝදනාවක් ලැබීමේ හේතුවක් නොදක්නා බැවින් තථාගතයන් වහන්සේ සැමදාසැමකල්හි ක්ෂේම - නිර්භයතාවට විශාරද බවට පැමිණ වාසය කරනසේක." යනු මෙහි තේරුමය.

### 3. අන්තරායිකයෙහි විශාරද ඥානය

"යෙ ඛො පන තෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා තෙ පටිසෙවතො නාලං අන්තරායායාති, තත්‍ර වත තථාගතං සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා ලොකස්මිං සහ ධම්මෙන පටිචොදෙස්සතී ති නිමිත්තමෙතං තථාගතො න සමනුපස්සති, එතම්පි නිමිත්තං අසමනුපස්සන්තො තථාගතො ඛෙමප්පත්තො අභයප්පත්තො වෙසාරජ්ජප්පත්තො විහරති."

" ඔබවහන්සේ විසින් යම් ඒ අන්තරායික ධර්ම කෙනෙක්, මොවුහු සගමොක් දෙකට අන්තරායික යයි දේශනා කරන ලද්දාහු ද ඒවා සගමොක් දෙකට අන්තරාදායක නොවෙත්ම යයි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ හේතු කරුණු සාධක සහිතව චෝදනා කරන්නේය යන කාරණය තථාගතයන් වහන්සේ ඒකාන්තයෙන් නොදක්නා සේක. එම චෝදනාවට හේතුවක් නිමිත්තක් ද නොදක්නා වූ තථාගතයන් වහන්සේ ක්ෂේම - නිර්භයතාවට විශාරද බවට පැමිණ වාසය කරන සේක." යනු ඒ පාඨයෙහි තේරුමය.

4. නෛර්යාණික ධර්මයෙහි විශාරද ඥානය

"යසස ච බො පන තෙ අත්ථාය ධම්මො දෙසිතො සො න නියයාති තක්කරසස සම්මා දුක්ඛක්ඛයා යාති, තත්‍ර වත තථාගතං සමණො වා බ්‍රාහමණො වා දෙවො වා මාරො වා බ්‍රහමා වා කොචි වා ලොකසමිං සහධම්මෙන පටිචොදෙස්සතීති නිමිත්තමෙතං තථාගතො න සමනුපසසති, එතමපි නිමිත්තං අසමනුපසසන්තො තථාගතොඛෙමප්පත්තො අභයප්පත්තො වෙසාරජ්ජප්පත්තො විහරති."

"ඔබවහන්සේ විසින් යම් ඒ නිර්වාණාවබෝධයක් පිණිස ධර්මය දේශනා කරන ලද්දේ ද, ඒ ධර්මය තෙමේ එහි හැසිරෙන අනුගමනය කරන අය නිවනට පමුණුවන්නේ නැතැයි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ ලෝකයෙහි කවර කෙනෙක් හෝ හේතු කරුණු සාධක සහිතව චෝදනා කරන්නේය යන කාරණය තථාගතයන් වහන්සේ ඒකාන්තයෙන් නොදක්නා සේක. මෙවැනි චෝදනාවකට නිමිත්තක් ද නොදක්නා වූ තථාගතයන් වහන්සේ ක්ෂේම - නිර්භයතාවට විශාරද බවට පැමිණ වාසය කරන සේක." යනු ඒ පාඨයෙහි තේරුමය.

ඉහත දැක්වූ දේශනා පාඨයන් ගෙන් පැහැදිළි වන විශාරද බව ඥාන දර්ශන විශේෂයක් බැවින් විශාරද ඥාන සතර යයි කියනු ලැබේ. පළමුවැනි විශාරද නුවණ බුද්ධත්වය ගැනය. එහි බුද්ධත්වය පැහැදිළි කරන මහා නිද්දේසපාලියෙහි එන සූත්‍ර පාඨයක් මෙසේය:

බුද්ධොති කෙනට්ඨෙන බුද්ධො, බුජ්ඣිතා සච්චානීති බුද්ධො, බොධෙතා පජායාති බුද්ධො, සබ්බඤ්ඤුතාය බුද්ධො, සබ්බ දස්සාවිතාය බුද්ධො, අනඤ්ඤ නෙය්‍යතාය බුද්ධො, විසවිතාය බුද්ධො, ඛීණාසව සංඛාතෙන බුද්ධො, නිරුපලෙප සංඛාතෙන බුද්ධො, එකන්ත වීත රාගොති බුද්ධො, ඒකන්ත වීතදොසොති බුද්ධො, ඒකන්ත වීතමොහොති බුද්ධො, එකන්ත නික්කිලෙසොති බුද්ධො, එකායන මග්ගං ගතොති බුද්ධො, එකො අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුද්ධොති බුද්ධො, අබුද්ධි විහතත්තා බුද්ධි පටිලාභාති බුද්ධො.

තේරුම: බුද්ධෝ යනු කවර අර්ථයකින් බුද්ධ නම් වේ ද සත්‍යයන් අවබෝධ කළ බැවින් බුද්ධ නම් වන සේක. අන් අයට අවබෝධ කරවූ බැවින් ද බුද්ධ නම් වන සේක. සියල්ල දන්නා බැවින් ද බුද්ධ නම් වන සේක. සියල්ල දක්නා බැවින් ද බුද්ධ නම් වන සේක. අනෙකෙකු විසින් නොකළ ස්වයං අවබෝධය ඇති බැවින් ද බුද්ධ නම් වන සේක. පියුමක් සේ තමන්ම ප්‍රබුද්ධ වී කෙලෙස් නින්දෙන් අවදි වූ බැවින් ද බුද්ධ නම් වන සේක. ක්ෂීණාස්‍රව බැවින් ද බුද්ධ නම් වන සේක. කෙලෙස් තැවරීමක් නොමැති බැවින් ද බුද්ධ නම් වන සේක. ඒකාන්තයෙන් වීතරාගී බැවින් ද බුද්ධ නම් වන සේක. ඒකාන්ත වීත දෝෂ බැවින් ද බුද්ධ නම් වන සේක. ඒකාන්ත වීත මෝහ බැවින් ද බුද්ධ නම් වන සේක. ඒකාන්ත නික්ලේශී බැවින් ද බුද්ධ නම් වන සේක. ඒකායන මාර්ගයෙහි ගමන් කළ බැවින් ද බුද්ධ නම් වන සේක. එකලාව අනුත්තර සම්බෝධියට පත් වූ බැවින් ද බුද්ධ නම් වන සේක. අබුද්ධිය හෙවත් අවිද්‍යාව නසා බුද්ධිය හෙවත් විද්‍යාව ලත් බැවින් ද බුද්ධ නම් වන සේක.

"බුද්ධොති නෙතං නාමං මාතරා කතං න පිතරා කතං න භාතරා කතං න භගිනියා කතං න මිත්තාමච්චෙහි කතං න ඤාතිසාලොහිතෙහි කතං න සමණබ්‍රාහ්මණෙහි කතං න දෙවතාහි කතං, විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුත ඤාණ පටිලාභා සච්ඡිකා පඤ්ඤත්ති යදිදං බුද්ධො ති."

"බුද්ධෝ යන මේ උත්තම නාමය මෑණියන් කළ නමක් නොව පියාණන් කළ නමක් නොව, සහෝදරයා කළ නමක් නොව, සහෝදරී කළ නමක් නොව, හිත මිතුරන් කළ නමක් නොව, සහලේ නෑයන් කළ නමක් නොව, ශ්‍රමණ බ්‍රාහ්මණයන් කළ නමක් නොව, දෙවි බඹුන් කළ නමක් නොව, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේලාට බුදුවන බෝ මුලදී විමෝක්ෂාන්ත නම් වූ රහත් මග ඵල කෙළවරදී සර්වඥතා ඥාන ප්‍රතිලාභයත් සමගම සත්‍යාවබෝධය නිමිති කොට ලැබුණු ප්‍රඥප්ති ගුණ නාමය බුද්ධ නම් වන සේක." යනු ඒ පාඨයෙහි කෙටි තේරුමය.

බරණැස ඉසිපතනාරාම මිගදායෙහිදී "යතො ච ඛො මෙ භික්ඛවෙ ඉමෙසු චතූසු අරියසච්චෙසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං සුවිසුද්ධං අහොසි. අථාහං භික්ඛවෙ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙව මනුස්සාය අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං"

මහණෙනි! යම් තැනකදී මා හට මෙම චතුරාර්ය සත්‍යයන් පිළිබඳව මෙසේ පිරිවැටුම් තුනක් සහිත වූ දොළොස් ආකාර වූ යථාභූත ඥාන දර්ශනය අතිශයින් සුවිශුද්ධ වී ද, මහණෙනි! එතැන් සිට මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත දෙව් මිනිසුන් සහිත සත්ත්ව ප්‍රජාව කෙරෙහි අනුත්තර සම්මා සම්බෝධිය නම් වූ සර්වඥතා ඥානය අවබෝධ කෙළේ වෙමි'යි ප්‍රතිඥා කෙළෙමි යි. පළමු වරට පස්වග මහණුන් වහන්සේලා හමුවෙහි බුදුබව ප්‍රකාශ කළ සේක. ඒ වචනය දස දහසක් සක්වළට එක හඬින් ඇසිණි. දස දහසක් ලෝක ධාතු සාධුකාර දෙන්නා සේ අතිශයින් කම්පා වූහ.

විශාලා මහනුවර ගෝතමක චෛත්‍යයේ දී පන්සියයක් භික්ෂූන් ඉදිරිපිට තෙවරක් බුදු බව ප්‍රකාශ කළ සේක. තෙවරක්ම පොළොව කම්පා විය. සාකේත නුවර දී කාලකාරාමයේ දී කාලකාරාම සූත්‍ර දේශනාවේ දී පස්වරක් බුදු බව ප්‍රකාශ කළ සේක. පස්වරක් පොළොව කම්පා විය. රජගහ නුවරටත් නාලන්දාවටත් අතර අඹ වනයේ දී හැට දෙවාරයක් බුදු බව ප්‍රකාශ කළ සේක. හැට දෙවාරයක් ම පොළොව කම්පා විය. සේල බ්‍රාහ්මණ තුමා ඉදිරියේ තුන්සියයක් මානවක පිරිසට ගාථාවකින් බුදු බව ප්‍රකාශ කළ සේක.

අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං - භාවෙතබ්බඤ්ච භාවිතං
පහාතබ්බං පහීනං මෙ - තස්මා බුද්ධොස්මි බ්‍රාහ්මණ

යනුවෙනි.

බ්‍රාහ්මණය! මා විසින් විශිෂ්ඨ ඥානයෙන් දත යුතු වූ ආර්ය සත්‍යය විශිෂ්ඨ ඥානයෙන් අවබෝධ කරන ලදී. භාවනා වශයෙන් වැඩිය යුතු වූ

මාර්ගය භාවනාවෙන් වඩන ලදී. ප්‍රහාණය කළ යුතු වූ සමුදය ප්‍රහාණය කරන ලදී. එසේ හෙයින් මම බුද්ධ නම් වෙමි'යි වදාළ කෙණෙහි සේල බ්‍රාහ්මණතුමා සහිත තුන්සියයක් මානවකයෝ පැවිදි වී අර්හත්වය සාක්‍ෂාත් කළහ.

සර්වඥයන් වහන්සේ අභීතව අටපිරිසෙහි සිංහනාද කරමින් මෙසේ බුදු බව ප්‍රතිඥා කරන සේක. දත යුතු තාක් සියල්ල ස්වයංභූඥානයෙන් සර්වප්‍රකාරයෙන් දැන බුදු බව ප්‍රතිඥා කරන සර්වඥවයන් වහන්සේ බුදු බවට පටහැනිව කරුණු සහිත යමක් ප්‍රකාශ කිරීමට සමතෙක් මේ තුන් ලෝක ධාතුවෙහි කොතැනකවත් ඇත්තේම නැත. එසේ හෙයින් මාගේ දශබලධාරී සර්වඥ රාජෝත්තමයන් වහන්සේ බුද්ධත්වයෙහි ලා නොසැලෙන සේක. නිර්භය වන සේක. විශාරද වන සේක.

2. ආ භවග්ගං ආ ගොත්‍රභුං වා සවන්ති ති ආසවා - භූමි වශයෙන් භවාග්‍රය දක්වා ද, ධර්ම අරමුණු වශයෙන් ගෝත්‍රභූ සිත දක්වා ද සත්ත්ව සන්තානයෙහි කැකෑරෙමින් පල්වෙමින් හා වැගිරෙමින් පවත්නා බැවින් ආශ්‍රව නම් වූ ධර්මතා සතරක් ඇත්තාහ. කාමාශ්‍රව - භවාශ්‍රව - දිට්ඨාශ්‍රව හා අවිද්‍යාශ්‍රව නමිනි. පරමාර්ථ වශයෙන් ඒ සතර ලෝභ දිට්ඨි මෝහ නමින් තිදෙනෙකි. ලෝභ මූල අකුසල් සිත් අටෙහි කාමාශ්‍රව භවාශ්‍රව දෙක ද, දිට්ඨිගත සම්ප්‍රයුක්ත අකුසල් සිත් සතරෙහි දිට්ඨාශ්‍රවය ද අකුසල් සිත් දොළොසෙහි අවිද්‍යාශ්‍රවය ද යෙදෙති.

සෝතාපත්ති මාර්ගයෙන් දිට්ඨාශ්‍රවය ද අනාගාමී මාර්ගයෙන් කාමාශ්‍රවය ද අර්හත් මාර්ගයෙන් භවාශ්‍රව අවිද්‍යාශ්‍රව දෙක ද ප්‍රහාණය කරනු ලැබෙති. සර්වඥ සම්මා සම්බුදුරජාණන්වහන්සේ බෝධි මූලයේ දී වාසනා සහිත වූ ම ආශ්‍රවයන් සර්වප්‍රකාරයෙන් ප්‍රහාණය කළ සේක. සතර මග නැණින් නැසූ ආශ්‍රවයෙන් නැවත නූපදවමින් අමා මහ නිවනට සැපත් වූ සේක. එසේ ක්‍ෂීණාශ්‍රව සංඛ්‍යාත වූ සර්වඥරාජෝත්තමයන් වහන්සේ ගේ නික්ලේශී බවට පටහැනිව කරුණු සහිතව යමක් ප්‍රකාශ කළ හැකි සමතෙක් ක්‍ෂත්‍රිය-බ්‍රාහ්මණ-ගෘහපති-ශ්‍රමණයන් අතර ද නැත්තාහ. දෙවියන් මාරයන්

බ්‍රහ්මයන් අතර ද නැත්තාහ. එසේ හෙයින්ම මාගේ ස්වාමී වූ සර්වඥ රාජෝත්තමයන් වහන්සේ ආශ්‍රවක්‍ෂයෙහි ලා නොසැලෙන සේක. නිර්භය වන සේක. විශාරද වන සේක. අටපිරිසෙහි සිංහනාද කරන සේක. ශ්‍රේෂ්ඨතම වූ ශ්‍රී සද්ධර්මචක්‍රය පවත්වන සේක.

3. සුගතියට හා නිවනට බාධාවන අන්තරායික කරුණු පසක් වදාර ඇත්තාහ. කර්මාන්තරාය, ක්ලේශාන්තරාය, විපාකාන්තරාය, උපවාදාන්තරාය සහ ආඥාව්‍යතික්‍රමණාන්තරාය යනු ඒ අන්තරායික ධර්මයෝ පස් දෙන වෙති. සුගතිය යනු කුසල චිත්ත විපාක වශයෙන් ප්‍රතිසන්ධි උත්පත්ති ලැබෙන මිනිස් ලොව, සදෙව්ලොව, බඹලොව, අරූප ලෝකය යනාදී කුසල විපාකයෙන් උපදින ගතිය හෙවත් භූමි සියල්ල සුගතිය නම් වේ. සියලු දුක්ඛයන් තරණය කොට පැමිණිය යුතු වන ශාන්ති ලක්‍ෂණ අමෘත මහා නිර්වාණ ධාතුව මෙහි නිවන නම් වන්නේය. එම සුගතියටත් නිවනටත් බාධාවන අන්තරාවෝ පස් දෙනෙකි.

ඉහත දක්වූ ඒ පස් දෙනා අතුරෙන් කර්මාන්තරාය යනු පඤ්චානන්තර්ය කර්මයයි. මව් මැරීම, පියා මැරීම, රහතුන් මැරීම, සංඝයා භෙද කිරීම, හා බුද්ධ ශරීරයෙහි ලේ සෙලවීම යනුවෙන් තිබෙන ආනන්තර්ය කර්මයෝ වනාහි සුගතියට හා නිවනට එකහෙලාම බාධා කෙරෙති. කිසිසේත්ම ඒවා ප්‍රතිබාහනය කළ නොහැකි වෙයි. මනුෂ්‍යයකු විසින් මනුෂ්‍ය වූ ම ස්වකීය මව හෝ පියා මැරීම ද, රහතුන් මැරීම ද, බුද්ධ ශරීරයෙහි ලේ සෙලවීම ද, සංඝයා භේද කිරීම ද පටිඝ සම්ප්‍රයුක්ත අකුශල චිත්තයෙන් ම සිදු කෙරේ. එම පටිඝ සම්ප්‍රයුක්ත වූ චිත්ත වීථියෙහි සත් වැනි ජවන් සිතෙහි ඇත්තා වූ චේතනාව වනාහි මෙලොවින් චුත වන අන්තිම සිතට අනතුරුවම නියත වශයෙන් අපාය ප්‍රතිසන්ධිය ගෙන දෙන බැවින් ආනන්තරිය නම් වෙයි. දෙව්දත් තෙරුන් අජාත ශත්‍රු රජු දූෂී මාර වැනි අය චුතියට අනතුරුව අපායෙහි උපත ලැබූ බව සුප්‍රසිද්ධයි. කොපමණ කුසල් රැස් කළ ද අනතුරු ආත්මභාවයෙහි නියතයෙන් ම අපාය ප්‍රතිසන්ධිය ගෙන දෙති.

ක්ලේශාන්තරාය යනු නියත මිථ්‍යාදෘෂ්ටිය ය. නාස්තික දෘෂටිය, අහේතුක දෘෂ්ටිය, අක්‍රිය දෘෂ්ටිය යි නියත මිථ්‍යා දෘෂ්ටිය තෙවැදෑරුම් වෙයි. කර්මයක කිසිත් විපාකයක් නැතැයි ගැනීම නාස්තික දෘෂ්ටියයි. සත්ත්වයන්ගේ සැප දුක් දෙක හා සංසාර ගමන කිසිත් හේතුවක් නොමැතිව ඉබේම සිදුවන්නේ යැයි ගැනීම අහේතුක දෘෂ්ටියයි. කයින් වචනයෙන් සිතින් කෙරෙන කවර දෙයකින් වත් කර්මයක් සිදුවන්නේ නැතැයි ගැනීම අක්‍රිය දෘෂ්ටියයි. මේ තුන් ආකාර වූ ඔවුනට අනුලෝම වූ ද සියලුම මිථ්‍යාදෘෂ්ටිය ක්ලේශාන්තරාය නම් වේ. එම මිථ්‍යාදෘෂ්ටිය අත්නොහරින්නේ නම් සුගතියට නිවනට නියතයෙන් ම බාධාවන බැවින් එයද අන්තරාවකි. හදවතින් ම එම වැරදි දෘෂ්ටිය අත් හැරීමෙන් නිවනට, සුගතියට බාධා නොවන්නේය.

විපාකාන්තරාය යනු අහේතුක ප්‍රතිසන්ධිය හා ද්විහේතුක ප්‍රතිසන්ධියයි. දුගති අහේතුක, සුගති අහේතුක යයි අහේතුක ප්‍රතිසන්ධි දෙකක් ඇත. සතර අපාගත සියලු සත්ත්වයන්ගේ උපත දුගති අහේතුක ප්‍රතිසන්ධියෙන් සිදු වේ. මිනිස් ලොව හා භුමාටු දෙවියන් අතරත් සුගති අහේතුක ප්‍රතිසන්ධිය ලැබේ. උපතින් ම අඳ-ගොළු-බිහිරි- උන්මත්තක-මන්ද බුද්ධිකයන්ගේ ප්‍රතිසන්ධිය අහේතුක ය. ප්‍රතිසන්ධි විපාක චිත්තයෙහි අලෝභ-අදෝස-අමෝහ යන චෛතසික එකකුත් නොමැති නම් අහේතුක ප්‍රතිසන්ධිය වේ. අලෝභ, අදෝස හේතු දෙක පමණක් යෙදී අමෝහය නොලැබෙන ප්‍රතිසන්ධි සිත වනාහි ද්විහේතුක නම් වේ. අහේතුක, ද්විහේතුක ප්‍රතිසන්ධිකයන්ට සුගති ගමනට බාධා නැතත් ධ්‍යාන අභිඥා විදර්ශනා ඥාන මාර්ග ඵල කිසිසේත් ඒ ජීවිතයේ දී නොලැබෙති. එහෙයින් අන්තරායකි.

උපවාදන්තරයාය යනු මාර්ග ඵල ලාභී ආර්ය උත්තමයන් හට ගර්හා කිරීමය. සිඛී බුද්ධ ශාසනයේ දී රහත් භික්ෂුණියකගේ අත් වරදකින් සෑ මළුවේ පතිත වූ කෙළ පොදක් දැක ගර්හා කළ පවින් ආත්මභාව දස දහසකදී දුක්ඛ විපාකයන්ට පාත්‍ර වූ අම්බපාලියට එතෙක් කල් නිවනට බාධා වූයේ ආර්ය උපවාදයය. ලක්දිව විසූ රහතන් වහන්සේ නමක් ඉතා

උදෑසනක දී හටගත් අධික ජඨරාග්නිය හේතු කොට පිඬු සිඟා ලබා ගත් හුළු කැඳ දූව ගොඩක් උඩ වාඩි වී වළඳනු දැක කිපුණු වෙනත් භික්ෂුවක් ඒ රහතන් වහන්සේට ගර්හා කළහ. එදින දවල් දානයෙන් පසුව එම රහතන් වහන්සේ උපවාද කළ භික්ෂුවත් සෝවාන් වී සිටි නමුත් ඉතිරි මාර්ග ඵල ලැබීමට බාධා නොවනු පිණිස ක්ෂමාව දුන් සේක.

ගර්හාවට ලක් වූ ආර්යයන් වහන්සේගේ ආර්යභාවය නොදැන ගර්හා කරන ලද්දේ ද නිවනට බාධාවකි. යම් දිනක ස්වකීය වරද පිළිගෙන ආර්යයන් වහන්සේගේ සමාව ගැනීමෙන් පසු සුගතියට - නිවනට බාධා නොවන්නේය. ක්ෂමාව ගැනීමට ආර්යයන් වහන්සේ සොයාගත නොහැකි වූයේ නම්, ඒ දිසාව සළකා වැඳ නමස්කාරයෙන් ක්ෂමාව ලබාගත යුතුය. පිරිනිවන් පා ඇතොත් ආදාහන මළුවට හෝ ගොස් වැඳ ක්ෂමාව ගත යුතුය. ක්ෂමාව ගන්නා තුරු ධ්‍යාන අභිඥා විදර්ශනා මාර්ග ඵල ලැබීමට බාධා වන බැවින් එය අන්තරායකි.

ආඥා ව්‍යතික්‍රමනාන්තරාය යනු සමාදන්ව ගත් ශික්ෂාපද ශීලය කඩකිරීමය. ලාභ-යස-ඥාති-අංග-ජීවිත යන පස් කරුණෙන් කවරක් හෝ හේතු කොට ශික්ෂාපද කඩ කිරීම වරදකි. ඉතා කුඩා වුවද ශික්ෂා පදය දැන දැන උල්ලංඝනය කිරීම සුගතියට - නිවනට බාධාවකි. පුරා අවුරුදු විසිදහසක් පිරිසිදුව සිල් රැක්ක ගරු ස්වාමීන් වහන්සේ නමක් මරණාසන්නයේ දී සිහිපත් වූ ඉතා කුඩා දූස්කට ඇවතක් හේතුවෙන් බුද්ධාන්තරයක්ම අහේතුක ප්‍රතිසන්ධියෙන් නාග භවනයෙක උපත ලැබූහ. ඒරකපත්‍ර නම් වූ ඒ නා රජු නිසා අප බුදුරජාණන් වහන්සේ දෙසූ දහමින් අසූහාර දහසක් දෙනා මග ඵල නිවන් ලැබූහ. එතෙක් ජනතාව තමන් නිසා නිවනට පත් වූ නමුත් ඒරකපත්‍ර නාගරාජයා මග ඵල නිවනට තවමත් පැමිණීමට නොහැකිව සිටිනුයේ ආණාවිතික්කමනාන්තරාය වූ බැවිනි.

පාතිමොක්ඛං විසොධෙන්තො - අපෙව ජීවිතං ජහෙ

පඤ්ඤත්තං ලොකනාථෙන - න භින්දෙ සීල සංවරං

"ප්‍රාතිමොක්ෂය හෙවත් ශික්ෂාපද ශීලය පිරිසිදුව රක්නේ ජීවිතය අතහැරීම යෙහෙකි. ලෝක නාථයන් වහන්සේ විසින් පනවන ලද ශීල සංවරය නොබිඳින්නේය" යනු ගාථාවේ කෙටි තේරුමය.

ආඥා දේශනා - වෝහාර දේශනා - පරමත්ථ දේශනා නමින් ත්‍රිපිටකය හැඳින්වේ. මහා කරුණාවත් සරුවඥතාඥානයත් ඇති බැවින් බුදුරජාණන් වහන්සේ සර්වඥතාඥානයෙන් සියල්ල දැන මහා කරුණාවෙහි පිහිටා සික පද පණවන සේක. ආඥාදායක සර්වඥයන් වහන්සේ විසින් පණවන ලද බැවින් විනය පිටකය ආඥා දේශනා නම් වේ. සර්වඥයන් වහන්සේ විසින් පණවන ලද ආඥා දේශනාවට අයත් වූ ඉතා කුඩා වුවද සික පදයක් කැඩීම ආඥාව්‍යතික්කමන නම් වේ. එය බලවත් වූ ම අන්තරාවකි.

යාවකිවඤ්ච භික්ඛවෙ භික්ඛු අප්පඤ්ඤත්තං න පඤ්ඤාපෙස්සන්ති. පඤ්ඤත්තං න, සමුච්ඡින්දිස්සන්ති, යථා පඤ්ඤත්තෙසු සික්ඛා පදෙසු සමාදාය වත්තිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකංඛා නො පරිහානි.

"මහණෙනි! යම් තාක් භික්ෂූන් වහන්සේලා තථාගතයන් වහන්සේ විසින් නොපැණ වූ සිකපදයක් නොපණවන්නාහු ද, පණවන ලද සික පදයක් නොසිඳින්නාහු ද, සික පද පණවා ඇති පරිදි මනාව සමාදන්ව පවතින්නාහු ද ඒතාක් කල් භික්ෂූන් ට දියුණුවම බලාපොරොත්තු විය යුතුය. පිරිහීමක් නොවන්නේය." යනු එම සූත්‍ර පාඨයෙහි කෙටි තේරුමය.

මහා සාගරයේ ආශ්චර්යය අද්භූත කරුණු අට අතුරෙන් දෙවැන්න නම් මහා සාගරය කිසි කලකත් වෙරළ නො ඉක්මවන්නේය. ශාසනයෙහි භික්ෂූන් වහන්සේලා ද ජීවිත හේතුවෙනුදු සික පද නොබිඳින සීලවන්තයා ආධ්‍යාත්මික අනවද්‍ය සුඛයක් විඳගන්නේය. අඛණ්ඩව අච්ඡිද්‍ර-අසබල-අකල්මාස-භුජිස්ස-විඤ්ඤුප්පසත්ත - අපරාමට්ඨ සමාධි සංවත්තනික නම් වූ අට කරුණකින් පිරිපුන්ව රක්නා සීලය සිතට මහත් සතුටක් ගෙන දෙන්නේය. එයින් මහත් ප්‍රීතියක් ද, පස්සද්ධිය ද, සැපය ද සමාධිය ද, පහළ වන්නේය. මග ඵල නිවනට ද පමණුවන විසුද්ධ ශීලය බුද්ධ

ශාසනයෙහි ආදිකල්‍යාණ ධර්මය ය. සික පද බිඳීම සර්වඥයන් වහන්සේට ද කරන අගෞරවයකි. ආඥාදායක ද වූ, ආඥාර්හද වූ, සර්වඥයන් වහන්සේ පණවා වදාළ සික පද බිඳීම සුගතිමගට හා මග ඵල නිවනට බාධාවක් වන බැවින් ආඥාව්‍යතික්‍රමණාන්තරාය නමින් හැඳින්වේ. මෙසේ පස්වැදෑරුම් වූ අන්තරායික කරුණු පිළිබඳ තථාගතයන් වහන්සේ ක්ෂේම-නිර්භය-විශාරද වන සේක.

මහා සාගරයෙහි කොතැනින් දිය බින්දුවක් ගත්තේ ද එක්වැනි ලුණු රසයෙන් යුක්ත වන්නා සේම බෝධිමූලයේ දී අනෙක ජාති සංසාරං ගාථාවේ සිට පිරිනිවන් ඇඳෙහි අප්පමාදෙන සම්පාදෙථ යන අන්තිම බුද්ධ වචනය දක්වා පන්සාලිස් වසක් තිස්සේ දෙසූ යම්තාක් බුදුබණ පද ඇත්තාහු ද ඒ සියල්ල මෙලොව සැපය, පරලොව සැපය හා අමා මහ නිවන් සැපය සලසා දෙන බැවින් ම නෛර්යාණික නම් වේ. විශේෂයෙන් චතුරාර්ය සත්‍යය අවබෝධයට හේතුවන එම නෛර්යාණික බුදුබණ නෛර්යාණික නොවේ යයි හේතු කරුණු සහිතව ප්‍රකාශ කිරීමට සමතෙක් තුන්ලෝකයේ ම නොමැත්තේය.

සුනක්ඛත්ත ලිච්ඡවිපුත්‍ර භික්ෂුව විශාලා මහනුවර තැන් තැන්වල ඇවිදිමින් "තථාගතයන් වහන්සේ සියල්ල දත් සර්වඥ කෙනෙක් නොවන්නේ නමුත් තර්ක විතර්ක කරමින් දෙසූ ධර්මය පිළිපන්නවුන්ට මගඵල නිවන ගෙන දෙන්නේම ය"යි ධර්මයෙහි නෛර්යාණිකත්වය ප්‍රකාශ කළේය. ඒ කථාව නිමිති කොට මජ්ඣිම නිකායෙහි මූලපණ්ණාසකයෙහි දැක්වෙන මහාසිහනාද සූත්‍රයෙන් ගාම්භිර බුද්ධ ඥාන රාශියක් දේශනා කරන ලදී. නෛර්යාණික ධර්මය නෛර්යාණික නොවන්නේ යයි ප්‍රකාශ කිරීම වනාහි සර්වඥතාඥාන ජින චක්‍රයට පහර දීමකි. එම ප්‍රකාශය අත් නොහැර එම දෘෂ්ටිය අත් නොහැර කළුරිය කෙරේ නම් හිසේ තිබුණු බර බහා තබන්නා සේ ද, අර්හත් මාර්ගයට අනතුරුව අර්හත් ඵලයට පැමිණෙන්නා සේ ද, ඒකාන්තයෙන් චුතියට අනතුරුවම නරකාදියට යන්නේ යයි මහාසිහනාද සූත්‍රයෙහිම වදාරා ඇත්තේය.

මෙසේ සතරක් වූ විශාරද ඥාන ඇති බැවින් ම තථාගතයන් වහන්සේ ක්ෂේම වන සේක. නිර්භය වන සේක. විශාරද වන සේක. ක්ෂත්‍රිය - බ්‍රාහ්මණ - ගෘහපති - ශ්‍රමණ යන සිවු පිරිසෙහි ද දිව්‍ය - තාවතිංස - මාර - බ්‍රහ්ම යන සිවු පිරිසෙහි ද සිංහනාද කරන සේක. ආසභස්ථානය හෙවත් ශ්‍රේෂ්ඨත්වය ප්‍රතිඥා කරන සේක. ධර්ම චක්‍රය පවත්වන සේක. "සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොති" එවැනි උතුමන් දැකීම ද උතුම් වන්නේය. "සාධු ඛො පන තථාරූපානං අරහතං සරණාගමනං හොති" එවැනි උතුමන් සරණ යාම ද උතුම් වන්නේය. "සාධු ඛො පන තථාරූපානං අරහතං උපසංකඛමනම්පි පයිරුපාසනම්පි සොතාවධානම්පි හොති" එවැනි උතුමන් වෙත පැමිණීම ද, නැවත නැවත පැමිණීම ද, සවන් දීම ද, අනුගමනය කිරීම ද උතුම් වන්නේය.

බුද්ධොපි බුද්ධස්ස භණෙය්‍ය වණ්ණං,
කප්පම්පි චෙ අඤ්ඤං මහාසමානො,
ඛියෙථ කප්පො චිර දීඝමන්තරෙ,
වණ්ණො න ඛියෙථ තථාගතස්ස. (මහා නිද්දේස පාලි)

"ඉදින් කල්පයක් තිස්සේ අන් කිසිවක් නොදෙසා සර්වඥ බුදුරජාණන් වහන්සේ බුදුගුණ ම දේශනා කරන සේක් වුයේ ද, දීර්ඝ කාලයකින් කල්පය ගෙවෙන්නේය. එහෙත් බුදු ගුණ කියා නිම නොවන්නේය." එසේ හෙයින් බුදු ගුණ අනන්තය.

ඒවං අචින්තියා බුද්ධා - බුද්ධ ගුණා අචින්තියා,
අචින්තියෙසු පසන්නානං - විපාකො හොති අචින්තියො.

මෙසේ බුද්ධ ගුණයෝ ද අචින්ත්‍යයෝය, බුදුවරු ද අචින්ත්‍යයෝ ය. අචින්ත්‍ය වූ අප්‍රමාණ වූ බුදුවරුන් කෙරෙහි බුදු ගුණයන් කෙරෙහි පැහැදුනවුන්හට ලැබෙන විපාක ආනිසංසය ද අචින්ත්‍යම වන්නේය. අප්‍රමාණ වන්නේ වේ.

## චතුර් වෛසාරද්‍යඥාන පිරිත

1. සො භගවා ඉතිපි බුද්ධත්තෙ විසාරද ඤාණෙන සමන්නාගතො,
බුද්ධත්තෙ විසාරද ඤාණෙන සමන්නාගතො වත සො භගවා,

තං භගවන්තං බුද්ධත්තෙ විසාරද ඤාණෙන සමන්නාගතං සරණං ගච්ඡාමි, තං භගවන්තං බුද්ධත්තෙ විසාරද ඤාණෙන සමන්නාගතං සිරසා නමාමි. තෙන බුද්ධත්තෙ විසාරද ඤාණ තෙජසා සොත්ථි මේ හොතු සබ්බදා.

2. සො භගවා ඉතිපි ආසවක්ඛයෙ විසාරද ඤාණෙන සමන්නාගතො, ආසවක්ඛයෙ විසාරද ඤාණෙන සමන්නාගතො වත සො භගවා, තං භගවන්තං ආසවක්ඛයෙ විසාරද ඤාණෙන සමන්නාගතං සරණං ගච්ඡාමි, තං භගවන්තං ආසවක්ඛයෙ විසාරද ඤාණෙන සමන්නාගතං සිරසා නමාමි. තෙන ආසවක්ඛයෙ විසාරද ඤාණ තෙජසා සොත්ථි මේ හොතු සබ්බදා.

3. සො භගවා ඉතිපි අන්තරායිකෙ විසාරද ඤාණෙන සමන්නාගතො, අන්තරායිකෙ විසාරද ඤාණෙන සමන්නාගතො වත සො භගවා, තං භගවන්තං අන්තරායිකෙ විසාරද ඤාණෙන සමන්නාගතං සරණං ගච්ඡාමි, තං භගවන්තං අන්තරායිකෙ විසාරද ඤාණෙන සමන්නාගතං සිරසා නමාමි. තෙන අන්තරායිකෙ විසාරද ඤාණ තෙජසා සොත්ථි මේ හොතු සබ්බදා.

4. සො භගවා ඉතිපි නියයාණිකෙ විසාරද ඤාණෙන සමන්නාගතො, නියයාණිකෙ විසාරද ඤාණෙන සමන්නාගතො වත සො භගවා, තං භගවන්තං නියයාණිකෙ විසාරද ඤාණෙන සමන්නාගතං සරණං ගච්ඡාමි, තං භගවන්තං නියයාණිකෙ විසාරද ඤාණෙන සමන්නාගතං සිරසා නමාමි. තෙන නියයාණිකෙ විසාරද ඤාණ තෙජසා සොත්ථි මේ හොතු සබ්බදා.

නිතර භාවිතා කළ යුතු බලගතු පිරිතකි.

## චතුර් වෛසාරද්‍යඥාන භාවනාව

1. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ ආර්ය සත්‍යය අවබෝධයෙහි විශාරද ඥාන ඇති සේක. ආර්ය සත්‍යය අන්‍යයන්හට අවබෝධ කරවීමෙහි ද විශාරද ඥාන ඇති සේක. දත යුතු වූ සියලු දේ

දැනීමෙහි ද විශාරද ඥාන ඇති සේක. දත යුතු වූ සියලු දේ දැකීමෙහි ද විශාරද ඥාන ඇති සේක. අනුන් විසින් නොකොට තමන් විසින්ම අවබෝධ කිරීමෙහි ද විශාරද ඥාන ඇති සේක. කෙලෙස් තින්දෙන් අවදි වීමෙහි ද විශාරද ඥාන ඇති සේක. ක්ෂීණාශ්‍රවතාවෙහි ද විශාරද ඥාන ඇති සේක. කෙලෙස් තැවරීම් නොමැති තත්වයෙහි ද විශාරද ඥාන ඇති සේක. ඒකාන්ත වීතරාගී තත්ත්වයෙහි ද විශාරද ඥාන ඇති සේක. ඒකාන්ත වීතදෝෂී තත්ත්වයෙහි ද විශාරද ඥාන ඇති සේක. ඒකාන්ත වීතමෝහී තත්ත්වයෙහි ද විශාරද ඥාන ඇති සේක. ඒකාන්ත නික්ලේෂී තත්ත්වයෙහි ද විශාරද ඥාන ඇති සේක. ඒකායන මාර්ගයෙහි ගමන් ගැනීමෙහි ද විශාරද ඥාන ඇති සේක. එකලාව අනුත්තර සම්මා සම්බෝධියට පැමිණීමෙහි ද විශාරද ඥාන ඇති සේක. අවිද්‍යාන්ධකාරය නැසීමෙහි ද විශාරද ඥාන ඇති සේක. විද්‍යාලෝකය පිළි ලැබීමෙහි ද විශාරද ඥාන ඇති සේක. බෝධි මූලයේ දී සතර මාර්ග සතර ඵල අවසානයෙහි සර්වඥතාඥනයට පැමිණීමෙහි ද විශාරද ඥාන ඇති සේක.

2. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ කාමාශ්‍රවය ප්‍රහාණය කිරීමෙහි ද විශාරද ඥාන ඇති සේක. භවාශ්‍රවය ප්‍රහාණය කිරීමෙහි ද විශාරද ඥාන ඇති සේක. දිට්ඨාශ්‍රවය ප්‍රහාණය කිරීමෙහි ද විශාරද ඥාන ඇති සේක. අවිද්‍යාශ්‍රවය ප්‍රහාණය කිරීමෙහි ද විශාරද ඥාන ඇති සේක.

3. මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ පඤ්චානන්තර්ය කර්මය නම් වූ කර්මාන්තරාවෙහි ද විශාරද ඥාන ඇති සේක. අහේතුක ද්විහේතුක ප්‍රතිසන්ධිය නම් වූ විපාකාන්තරාවෙහි ද විශාරද ඥාන ඇති සේක. නියත මිථ්‍යාදෘෂ්ටිය නම් වූ ක්ලේශාන්තරාවෙහි ද විශාරද ඥාන ඇති සේක. ආර්ය උතුමන් හට අගෞරවයෙන් ගර්හා කිරීම නම් වූ උපවාදාන්තරාවෙහි ද විශාරද ඥාන ඇති සේක. දැන දැන සිකපද බිඳලීම නම් වූ ආඥාව්‍යතික්‍රමනාන්තරාවෙහි ද විශාරද ඥාන ඇති සේක.

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ නෛර්යාණික වූ විනය පිටක දේශනාවෙහි ද විශාරද ඥාන ඇති සේක. නෛර්යාණික වූ සූත්‍රාන්ත පිටක දේශනාවෙහි ද විශාරද ඥාන ඇති සේක. නෛර්යාණික වූ අභිධර්ම පිටක දේශනාවෙහි ද විශාරද ඥාන ඇති සේක. නෛර්යාණික වූ ස්වාක්ඛාත ශ්‍රී සද්ධර්මයෙහි ද විශාරද ඥාන ඇති සේක. නෛර්යාණික වූ සාන්දෘෂ්ඨික ශ්‍රී සද්ධර්මයෙහි ද විශාරද ඥාන ඇති සේක. නෛර්යාණික වූ අකාලික ශ්‍රී සද්ධර්මයෙහි ද විශාරද ඥාන ඇති සේක. නෛර්යාණික වූ ඒහිපස්සික ශ්‍රී සද්ධර්මයෙහි ද විශාරද ඥාන ඇති සේක. නෛර්යාණික වූ ඕපනයික ශ්‍රී සද්ධර්මයෙහි ද විශාරද ඥාන ඇති සේක. නෛර්යාණික වූ පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි ශ්‍රී සද්ධර්මයෙහි ද විශාරද ඥාන ඇති සේක. නෛර්යාණික වූ පර්යාප්ති ශ්‍රී සද්ධර්මයෙහි ද විශාරද ඥාන ඇති සේක. නෛර්යාණික වූ ප්‍රතිපත්ති ශ්‍රී සද්ධර්මයෙහි ද විශාරද ඥාන ඇති සේක. නෛර්යාණික වූ ප්‍රතිවේධ ශ්‍රී ,සද්ධර්මයෙහි ද විශාරද ඥාන ඇති සේක.

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ චතුර් වෛශාරාද්‍ය ඥානයෙන් සමන්නාගත වන බැවින් සැමදා සැමතන්හි ක්ෂේම භාවයට පැමිණි සේක. නිර්භීත භාවයට පැමිණි සේක. විශාරද භාවයට පැමිණි සේක. බුද්ධත්වය ද ප්‍රතිඥා කරන සේක. අට පිරිසෙහි අභීතව සිංහනාදය ද කරන සේක. අනුත්තර ධර්ම චක්‍රය ද පවත්වන සේක. මෙසේ චතුර් වෛශාරාද්‍ය ඥානයෙන් සමන්නාගත වූ, චතුර් වෛශාරාද්‍ය විශාරද වූ, දේවාති දේව වූ, ශක්‍රාති ශක්‍ර වූ, බ්‍රහ්මාති බ්‍රහ්ම වූ මාර පරාජය කළා වූ, මහාමේරුව සේ උස් වූ, ගුණ ඇත්තා වූ, මහා පොළොව සේ පැතුරුණු ගුණ ඇත්තා වූ, මහා සාගරය සේ ගැඹුරු ගුණ ඇත්තා වූ, චන්ද්‍ර මණ්ඩලය සේ සෞම්‍ය ගුණ ඇත්තා වූ, සූර්ය මණ්ඩලය සේ ප්‍රභාස්වර ගුණ ඇත්තා වූ, අජටාකාශය සේ අනන්ත ගුණ ඇත්තා වූ, අනන්ත ඥාන ඇත්තා වූ, අනන්ත පුණ්‍ය ඇත්තා වූ, අනන්ත තේජස්

ඇත්තා වූ, අනන්ත ඍද්ධි ඇත්තා වූ, වන්දනෝයයාභි වන්දනෝයය වූ, පූජනෙයයාභි පූජනෝයය වූ, ත්‍රෛලෝක තිලක වූ, සමන්ත භද්‍ර වූ, සද්ධර්මවර චක්‍රවර්ති වූ, භාගයවත් වූ, අර්හත් වූ, සම්‍යක් සම්බුද්ධ වූ, ශාක්‍ය මුනීන්‍ද්‍ර සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා. මාගේ ජීවිතය ද පූජා වේවා. චතුර් වෛශාරාද්‍ය ඥාන බලයෙන් මාගේ සිත විශාරද බවට පැමිණේවා. මාගේ ශීලය ද විශාරද බවට පැමිණේවා. මාගේ සමාධිය ද විශාරද බවට පැමිණේවා. මාගේ ප්‍රඥාව ද විශාරද බවට පැමිණේවා. මාගේ සම්‍යක් ප්‍රාර්ථනාව ද විශාරද බවට පැමිණේවා. මා හට ශාන්ති ලක්‍ෂණ අමෘත මහා නිර්වාණ ධාතුව ඒකාන්තයෙන් සුවසේ සාක්‍ෂාත් වේවා.

*නිතර භාවිත කළ යුතු වූ බුදු ගුණ භාවනාවකි.*

සාධු! සාධු! සාධු!

**මෙම උතුම් ධර්ම ග්‍රන්ථයේ සම්පාදක සාසනධජ, ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය, මහෝපාධ්‍යාය, මහා කර්මස්ථානාචාර්ය අතිපූජනීය නා උයනේ අරියධම්මාභිධාන මහා නාහිමිපාදෝත්තමයාණන් වහන්සේගේ දෙපා නැමද ගෞරව පූර්වක භක්ති ප්‍රණාම නමස්කාර පූර්වකව මෙම ධර්ම ග්‍රන්ථය මුද්‍රණය කිරීමට දායක වූ සියලුම පිංවතුන් ද ගෞරව පූර්වකව සිහිපත් කරමින් ධර්ම දානමය පුණ්‍ය කර්මයක් ලෙස ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් මෙම ධර්ම ග්‍රන්ථය මෙසේ සකසන ලද්දේ අරියමග්ග සංවිධානය විසිනි.**

www.ariyamagga.org